## ❑ ලේ නෑ විවාහයක් යනු කුමක්ද ?

එය සමීප නෑකමක් ඇති පුද්ගලයින් අතර සිදුවන විවාහයකි.

උදා: සහෝදරයන් දෙදෙනෙකුගේ දරුවන්.
සහෝදරියන් දෙදෙනෙකුගේ දරුවන්.
සහෝදරයකුගේ සහ සහෝදරි -යකගේ දරුවන්.
පිරිමි දරුවෙකු සහ තම මවගේ/පියාගේ සොහොයුරිය.
ගැහැනු දරුවෙකු සහ තම මවගේ/පියාගේ සොහොයුරා.

## ❑ ඔබ ඉන් වැලකිය යුත්තේ ඇයි ?

එම විවාහවලින් උපදින දරුවන් නොයෙකුත් ආබාධ වලින් පෙලෙන්නන් වීමේ හැකියාව වැඩි බැවින්ය.

## ❑ මෙම ආබාධ මොනවාද ?

මන්දබුද්ධික බව, අන්ධ බව, බිහිරි බව, අත්පා වල නොයෙකුත් විකෘර්ති ඉන් සමහරකි.
සමහර ළමුන් උපන් විටම ඒවා දැකගත හැකි අතර අනෙක් ළමුන්ගේ ඒවා පසුව මතුවේ.

## ❑ මෙම ආබාධ ඇතිවන්නේ කෙසේද?

දරුවාගේ හැඩරුව, ඇසීම, පෙනීම ආදිය තීරණය වන්නේ ඔහුගේ/ ඇයගේ ජාන වලින් නිගමනය කරණ දේහ ලක්ෂණ මතයි.

ශරීරයේ සෑම සෛලයකම න්‍යෂ්ටියේ ඇති වර්ණදේහ තුළ ජාන අඩංගුය. සෑම සෛලයකම වර්ණදේහ 46ක් (යුගල 23ක්) ඇත. මින් 23 ක් මවගෙන්ද 23 ක් පියාගෙන්ද ලැබේ.

වර්ණදේහ සෛලයෙන් පිටතට ගෙන විශේෂ ක්‍රමයකට සකස් කරගත් විට පහත චිත්‍රයේ පෙනෙන ආකාරයට දැකගත හැක.
(23 වන වරණදේහ යුගල පිරිමියකුගේ XY වන අතර ස්ත්‍රියකගේ XX වේ)




සෑම මිනිසකුම සතුව 'නරක්වූ' ජාණ 4 සිට 8 පමණ ඇත. වර්ණදේහ යුගලක හොඳ ජාන දෙකක් හෝ හොඳ ජානයක් සහ 'නරක' ජානයක් ඇති විට දරුවා නිරෝගීවේ. එහෙත් 'නරක' ජාන දෙකක් ඇති විට දරුවා ආබාධවලින් පෙලේ.

සමීප නෑයන්ගේ ආච්චිලා සහ සීයලා එකම අය වන බැවින් ඔවුන්ගේ සෛල වල එකම වර්ගයේ 'නරක්වූ' ජාන ඇත. එබැවින් ලේ නෑ විවාහ වලදී 'නරක' ජාන යුගල වශයෙන් එක්වීමේ හැකියාව එසේ නොවන විවාහ වලට වඩා දෙගුණයකින් පමණ වැඩිය.

## ❑ මෙම දුර්විපාක වැලක්වීමට නම්

- ✓ ලේ නෑ විවාහ වලින් වලකින්න.
- ✓ ඔබගේ තරුණ දූ පුතුන් මේ ගැන දැනුවත් කරන්න.

## ❑ විවාහ පිළිබඳ සමාජයේ පවතින වැරදි මත

- ✗ සහෝදරයකුගේ සහ සහෝදරියක -ගේ දරුවන් අතර විවාහ ආබාධ සහිත දරුවන් බිහිනොකරයි.
- ✗ සහෝදරියන් දෙදෙනෙකුගේ දරුවන් අතර විවාහ ආබාධ සහිත දරුවන් බිහිනොකරයි.
- ✗ නෑ කමක් නැති පවුල් දෙකක වැඩිමල් දරුවන් අතර විවාහ සුදුසු නොවේ.

## ❑ ඔබට මේ පිළිබඳව කරුණු දැනගැනීමට අවශ්‍යනම් ජාන උපදේශක සේවාවක සහය ලබාගැනීම වඩා සුදුසුය.

## ❑ ජාන උපදේශක සේවාවක් යනු කුමක්ද?

ඔබට ඔබේ පෞද්ගලික අවශ්‍යතාවය -න්ට හා විශ්වාසයන්ට අනුරූපව ඔබටත් ඔබේ පවුලටත් ගැලපෙන පරිදි නිවැරදි තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ලබාදීම ජාන උපදේශක සේවාවක් නම්වේ. මෙම උපදෙස් ඕනෑම දොස්තරවරයකුගෙන් හෝ දොස්තරවරියකගෙන් ලබාගතහැක. එසේ උපදෙස් ලබාදෙන විට ඔහු/ ඇය කිසිවිටකත් තමාගේ තීරණ ඔබමත පටවන්නේ නැත.

## ❑ ජාන උපදේශක සේවා ලබාගතනේ කොතැනින්ද ?

ඔබ පවුල දන්නා හඳුනන ඔබගේ පවුලේ වෛද්‍යවරයා ඔබට උපදෙස්දීමට වඩාත්ම සුදුසු පුද්ගලයාය. ඔබට පවුලේ වෛද්‍යවරයකු නොමැතිනම් හෝ විශේෂඥ උපදෙස් ලබාගැනීමට අවශ්‍යානම් කොළඹ වෛද්‍ය පීඨයේ මානව ප්‍රවේනි ඒකකයට පැමිනෙන්න.


**මානව ප්‍රවේනි දැනුම ප්‍රචලිත කිරීමේ වැඩසටහන**

**මානව ප්‍රවේනි ඒකකය**

(Human Genetics Unit)

වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

කින්සි පාර, කොළඹ 8

දුරකථනය/ෆැක්ස් 011 289545

ර-මේල් office@hgucolombo.org

ඉන්ටර්නෙට් http://www.hgucolombo.org


# ලේ නෑ විවාහ වලින් වලකින්න

**ඔබ දැනගතයුතු කරුණු**

GENETIC COUNSELLING